# شرح ألفاظ الأذان

# අදාන්හි සඳහන් වදන්හි අර්ථ විග්‍රහය

# අදාන්හි සඳහන් වදන්හි අර්ථ විග්‍රහය

විවිධ භාෂා සඳහා වූ ඉස්ලාමීය අන්තර්ගත තොරතුරු පිළිබඳ සේවා සංගමයේ අධ්‍යයන කමිටුව

## අදාන්හි වදන් විග්‍රහය

විවිධ භාෂා සඳහා වූ ඉස්ලාමීය අන්තර්ගත තොරතුරු පිළිබඳ සේවා සංගමයේ අධ්‍යයන කමිටුව

අදාන් යනු දිනකට පස් වරක් මුස්ලිම් ජනතාවට ඇසෙන දිව්‍යමය ඇරයුමකි. එය ඔවුන්ට අල්ලාහ්ගේ මහිමාන්විතභාවය මතක් කරවමින් යහපත් කටයුතු හා විජයග්‍රහණය වෙත ආරාධනා කරයි. එය මනුෂ්‍යයා හා ඔහුගේ නිර්මාතෘ අතර සම්බන්ධතාවයක් ඇති කරවන නිමේෂයකි. එහි දී ඔහු කලබලකාරී ලෝකයෙන් දුරස් ව සියෙ පරමාධිපතියාණන් සමඟ සංවාදයක

නිරත වේ. අදාන් යනු සලාතයේ වේලාව පිළිබඳ දැනුම්දීමක් පමණක් නොව, එය සන්සුන්භාවය, විශ්වාසය හා අල්ලාහ් සමඟ වූ සබඳතාවය නැවත ප්‍රබෝධමත් කිරීම සඳහා කෙරෙන ඇරයුමකි. උත්තුංග අරුත්වලින් බරිත මෙකී අදානය අල්ලාහ්ගේ මහිමාන්විත ශ්‍රේෂ්ඨත්වය විදහා පාමින් ආරම්භ වී, සලාතය සඳහා වූ ඇරයුමෙන් අවසන් වන්නකි. මෙහි දී මුස්ලිම්වරයා සිය සැනසුම සොයා ගනු ඇත. සෑම වරක් ම අදාන් ඇරයුම් නාදය ඉහළ නැංවෙන කල, සත්‍ය ජීවිතය ආරම්භ වන්නේ දෙවිඳාණන් හා සමීප ව සිටින විට බව හදවත තුළ සිහින් කෙඳිරීමක් මතු වේ.

## අදාන්හි පද්‍ය පන්තිය මෙපරිදි ය:

**අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්.**

අල්ලාහ් අතිශ්‍රේෂ්ඨ යි.

උත්තරීතර සුවිශුද්ධ නාමය වන: 'අල්ලාහ්' යනු නැමදුම් ලැබීමට සුදුස්සා හා මැවුම්කරු වූ පරමාධිපතියාණන්ගේ නාමය යි. උතුමාණන්ගේ සියලු ම උත්තුංග නාම උතුමාණන්ට ගැළපෙන අතර ඒවා උතුමාණන්ගේ විශේෂිත වර්ණනා ය. අල්ලාහ් ඒකීයවන්තයා ය; ඔහුට කිසිදු දරුවෙක් නැත; ඔහු කිසිවෙකුගෙන් උපත ලැබූවෙක් ද නොවේ; උතුමාණෝ අහස් සහ මහපොළොවේ මැවුම්කරුවාණෝ ය.

'අල්ලාහු අක්බර්' යන වචනයේ අර්ථය වන්නේ, අල්ලාහ් සියලු දෑට වඩා අතිශය කීර්තිමත්, මෙන් ම ඔහුගේ මහිමාන්විතභාවය හා පූර්ණත්වය සඳහා නොගැළපෙන කිසිවක් ඔහුට සම්බන්ධ නොකළ යුතු ය යන්න යි.

'අල්ලාහු අක්බර්'.. මෙම ප්‍රකාශය මුස්ලිම්වරුන්ට සිහි කරවන්නේ, මෙම ජීවිතයේ කිසිවක් ඔවුන් ව ඔවුන්ගේ නිර්මාතෘවරයාගෙන් කාර්යබහුල

නොකළ යුතු බවත්, මිනිසා තම ජීවිතයේ අල්ලාහ්ගේ අභිමතය සහ උතුමාණන් පෙන්වා දුන් ජීවන පිළිවෙත අනුව ගමන් කළ යුතු බවත් මිසක තමන්ගේ කැමැත්ත සහ ඉච්ඡාවන් අනුව නොවේ. එසේ ම අල්ලාහ් මෙම ලෝකයේ ඇති සියලු දේවලට වඩා අතිශය කීර්තිමත් බවත් ය.

"අල්ලාහු අක්බර්" යන ප්‍රකාශය කම්කරුවෙකු අසන විට ඔහුගේ කර්මාන්තය නවතා දමයි; ගොවියා අසන විට ඔහුගේ කෘෂිකර්මය නතර කරයි; ව්‍යාපාරිකයා අසන විට ඔහුගේ ව්‍යාපාර ස්ථානය වසා දමයි; ගුරුවරයා අසන විට ඔහුගේ පාඩම නතර කරයි; එසේ කරනුයේ සියලු කාර්යවලට වඩා අල්ලාහ් අතිශ්‍රේෂ්ඨ බැවිනි. මෙම නැවැත්වීම හා ආගමික කටයුතු සඳහා යොමු වීම සිදු වන්නේ සියලු ලෞකික වස්තූන්වලට වඩා දෙවිදාණන් කෙරෙහි විශ්වාසය ඇති මුඃමින්වරයාගේ හදවතේ

උත්තරීතර අල්ලාහ් අතිශ්‍රේෂ්ඨ බවට සාක්ෂි සපයමිනි. සෑම විපතක්, ව්‍යසනයක් හා ජීවිතයේ ඕනෑ ම තත්ත්වයකට වඩා (අල්ලාහු අක්බර්) අල්ලාහ් අතිශ්‍රේෂ්ඨ ය. එය විශ්වාස කරන කෙනෙක් විපත්තිදායක දෑ කුඩා ලෙස සලකයි. ඔහුගේ හදවත නිවිසැනසිල්ලෙන් පිරී ඇත. මක් නිසා ද යත්, ඔහු අල්ලාහ් සමඟ ය; උතුමාණන්ගේ තීන්දුව කෙරෙහි තෘප්තිමත් ය; උතුමාණන්ගේ ප්‍රඥාව හා සැලසුම්කරණ ක්‍රියාවලිය පිළිබඳ විශ්වාසයෙන් යුක්ත ය.

## අෂ්හදු අන්ලා ඉලාහ ඉල්ලල්ලාහ්

අල්ලාහ් හැර නැමදුම් ලැබීමට සුදුසු අන් කිසිවෙකු නොමැති බව මම සාක්ෂි දරමි.

මෙය පළමු ෂහාදාව (සාක්ෂි දැරීම) වන අතර, එහි අර්ථය වන්නේ සර්වබලධාරී අල්ලාහ් විශ්වයේ මැවුම්කරු, එහි පරමාධිපති, හිමිකරු

සහ ක්‍රියාත්මක කරන බලධාරියා බව පිළිගැනීම යි. ඔහු පමණක් නැමදුම් ලැබීමට සුදුස්සා වන අතර, ඔහු හැර වෙනත් කිසිවෙක් නැමදුම් ලැබීමට සුදුස්සා නොවේ. ඔහු එක ම දෙවිඳාණන් වන අතර, ඔහුට කිසිදු ආදේශකරුවෙක් නැත, කිසිදු දරුවෙක් නැත, කිසිදු සමානයක් නැත; එබැවින් අල්ලාහ් හැර වෙනත් කිසිවෙකුට නැමදුම් නොකළ යුතු යි, අල්ලාහ් හැර වෙනත් කිසිවෙකුට යාච්ඤා නොකළ යුතු යි.

පවත්නා සාක්ෂීන් අතුරින් අතිමහත් සාක්ෂිය මෙය යි; සියලු දිව්‍යමය හෙළිදරව්වල සඳහන් විශ්වාසයේ මූලය ද මෙය යි; නූහ්, ඉබ්රාහීම්, මූසා, ඊසා ආදි නබිවරුන්ගෙන් පටන් දේව දූත මුහම්මද්තුමාණන් දක්වා වූ සියලු ම නබිවරු තම ජනතාවට අල්ලාහ් හැර නැමදුම් ලැබීමට සුදුසු කිසිදු දෙවියෙකු නොමැති බව ස්ථිර කිරීමටත්, පිළිගැනීමටත්, විශ්වාසය තැබීමටත්

ඇරයුම් කළහ. සර්ව නිර්මාණ අල්ලාහ් නිර්මාණය කළේ කිනම් පරමාර්ථයක් උදෙසා ද එකී පරමාර්ථය මෙම වදන උදෙසා ය. එය තහවුරු කිරීමට දේව දූතයන් යැවූ අතර, එය පැහැදිලි කිරීමට දේව හෙළිදරව් පහළ කළේය; එය අවංක ලෙසින් පවිත්‍ර හදවතින් දරා පැමිණෙන්නේ කවරෙකු ද ඔවුන් උදෙසා ස්වර්ගය ඇති කළේය. එය ස්ථිර ලෙස පිළිගනිමින් මිය යන අයට නිරය තහනම් කළේය.

මෙය විශ්වාසයේ යතුර යි, (අයහපතින්) මුදවා (නිරයෙන්) ගලවා ගැනීමේ දොරටුව යි, දහමේ මූලය ද ඒකදේවවාදයේ පදනම ද මෙය යි.

මෙම පාඨය උදෙසා ය මිනිසුන් ඔවුන්ගේ මිනීවළවල්වලින් යළි ප්‍රාණවත් කොට නැගී සිටවනු ලබනුයේ; පරමාන්ත දින ප්‍රශ්න විමසුමට ලක් කරනු ලබනුයේ. කවරෙක් හෝ එය පිළිපැද ජීවත් වී, එමඟින් ඔහුගේ ජීවිතය අවසන් කළේ

නම්, ඔහු ඉමහත් විජයග්‍රහණ හිමි කරගන්නේය. කවරෙකු එය ප්‍රතික්ෂේප කළේ ද, එය උච්චාරණය නොකළේ ද, ඔහු සදාකාලික ව අපා ගින්නේ රැඳී සිටීමට සුදුසුකම් ලබනු ඇත.

## අෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්, අෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්

සැබැවින් ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයෙකු බව මම සාක්ෂි දරමි.

මෙම සාක්ෂියේ අර්ථය වන්නේ අල්ලාහ් විසින් මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අවසාන දේව දූතයා ලෙස එවනු ලැබූ බවට සහ එතුමාණන් මිනිසුන් වෙත ඔවුන්ගේ ස්වාමියාණන්ගේ පණිවිඩය නිසි අයුරින් සැල කළ බවට මුස්ලිම්වරයා සාක්ෂි දැරීම යි. එමෙන් ම, අල්ලාහ්ට නැමදීමට හා අල්ලාහ්ගේ තෘප්තිය මඟින් විජයග්‍රහණය අත්පත් කර ගැනීමට නම්,

දේව දූතයාණන්ගේ දූතත්ත්වය කෙරෙහි සාක්ෂි දැරීමෙන් මිස වෙනත් මාර්ගයකින් එය හිමි කරගත නොහැක්කේ ම ය යන වග නිශ්චිත ලෙසින් මුස්ලිම්වරයා අවබෝධ කරගත යුතු යි. එලෙස ම එතුමාණන්ගේ පණිවිඩය පිළිපැදීම ද එතුමාණන්ගේ ආදර්ශ අනුගමනය කිරීම ද එතුමාණන් විසින් පෙන්වා දුන් ධාර්මික නීතිය අනුව අල්ලාහ්ට නැමදුම් කරමින් අවනත වීම ද කළ යුතු ම ය. මිනිසා අල්ලාහ්ට සමීප වීමට සිදු කරන සියලු ම නැමදුම්, එතුමාණන් විසින් සැල කොට පෙන්වා නොදුන් නම්, ඒවා අසත්‍ය නැමදුම් වන අතර එය මෙලොවෙහි හෝ පරලොවෙහි එම පුද්ගලයාට ප්‍රයෝජනවත් නොවේ. එසේ ම, එම නැමදුම් පිළිබඳ ඔහුට එරෙහි ව සටහන් කරනු ලබන අතර දඬුවම් ද හිමි වේ; මන්ද මිනිසා දේව දූතයාණන් පෙන්වා නොදුන් ක්‍රමයකින් අල්ලාහ්ට නැමදුම් කළ බැවිනි.

රසූල් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අල්ලාහ්ගේ ගැත්තා හා විශ්ව පරමාධිපතියාණන්ගේ දූතයා බවට හා රසූල් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සියලු ම දූතයින් අතුරින් අවසාන දූතයා බවට හා එතුමාණන්ගෙන් පසු තවත් නබිවරුන් නොපැමිණෙන බවට සාක්ෂි දැරීම මෙකී ෂහාදාවට අන්තර්ගත වේ. තව ද, එතුමාණන් ගෙන ආ සියලු ම සංඥා, විශේෂයෙන් ම අල් කුර්ආනය කෙරෙහි විශ්වාසය තැබීම ද උත්තරීතර අල්ලාහ්ගේ දිව්‍යමය අවසාන පණිවිඩය මෙය ම වන බවට විශ්වාස කිරීම ද, එය එහි මුල් භාෂාවෙන් ම තවමත් පවතින බවට හා එය වැඩි කිරීමකින්, අඩු කිරීමකින්, හෝ වෙනස් කිරීමකින් ආදි කවරාකාරයේ හෝ විකෘති වීමකින් ආරක්ෂා වී ඇති බවට විශ්වාස කිරීම ද මෙම ෂහාදාව තුළ ගැබ් වේ. මෙම ශුද්ධ වූ අල්-කුර්ආනයේ වාග් විලාශය, නීති සහ

මාර්ගෝපදේශ වෙනත් කිසිවකට සමාන කළ නොහැකි වන අතර, එවන් එක් පරිච්ඡේදයක් හෝ ගෙන එන මෙන් අල්ලාහ් මිනිස් වර්ගයාට අභියෝග කළේය. එහෙත්, වසර ගණනාවක් පුරා ම සහ අද දක්වා ම මිනිස් වර්ගයා ඒ සඳහා අපොහොසත් වූවෝය.

එමෙන් ම, නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්, අල්ලාහ්ගේ ඒකීයත්වය කරා යළිත් මිනිසුන් යොමු කිරීම උදෙසා පැමිණි බවට සාක්ෂි දැරීම ද මෙයට අදාළ ය. එතුමාණන්ට පෙර සිටි ඉබ්‍රාහීම්, මූසා, ඊසා (අලයිහිමුස් සලාම්) නම් දේව දූතයින් මිනිසුන් ව යොමු කළේ ද එය වෙත ම ය. මෙතුමාණන්, විශ්ව පරමාධිපතියාණන්ගේ දූතයාණන් වන අතර, සියලු ම නබිවරුන් තම පණිවිඩය ප්‍රකාශ කළ ආකාරයෙන් එකී දූතත්ත්ව වගකීම සනිටුහන් කිරීමේ මාර්ගය මෙතුමා ද අනුගමනය කළේය. එහෙත්,

නියතවශයෙන් ම මෙතුමාණන්ට පසු තවත් නබිවරයෙක් නැත.

## හය්ය අලස් සලාහ්, හය්ය අලස් සලාහ්

සලාතය වෙත වහා පැමිණෙන්න

පාඨයේ අදහස: අහෝ විශ්වාසවන්තයනි, නුඹලාගේ පරමාධිපතිට නැමදුම් කරනු වස් යොමු වන්න. සැබැවින් ම ඔහු අතික්ෂමාශීලී ය; අසමසම කරුණාන්විත ය; පශ්චාත්තාපය පිළිගන්නා ය; පාපකම්වලට සමාව ලබා දෙන්නා ය.

මුස්ලිම්වරුන් කණ්ඩායම් වශයෙන් සිටින සෑම ස්ථානයක ම එක් පුද්ගලයෙකුට සලාතය උදෙසා වූ කැඳවීම සිදු කරන ලෙස උත්තරීතර අල්ලාහ් අණ කිරීම කෙතරම් ඉමහත් ගෞරවයක් වේද! ඔහු දිනකට පස් වරක් ඔවුන් ව කැඳවමින් ඔබ සැමගේ පරමාධිපතිඳුන්ට

නැමදුම් කිරීම පිණිස යුහුසුලු ව පැමිණෙන්න යනුවෙන් පවසයි.

සිය පරමාධිපතිඳුන් වෙත නැමදුම් ඉෂ්ට කිරීමට වේලාව පැමිණ ඇති බව ඒකදේවත්වය කෙරෙහි විශ්වාසය තැබූ උදවිය උදෙසා කරන ඇරයුමකි; සිහිගැන්වීමකි එය. තමා ව කාර්යබහුලත්වයට පත් කරන සියලු ලෞකික කටයුතුවලින් ඉවත් ව ඒවා අතහැර නැමදුම් කිරීම පිණිස ඔවුන් යොමු විය යුතු වේ. සිය දෑත් හොවා ඇත්තා වූ ව්‍යාපාරය හෝ කෘෂිකර්මය වැනි දෑ අත්හැර උත්තරීතර අල්ලාහ් වෙත සම්මුඛ විය යුතු යි. මෙය සත්‍ය විශ්වාසය හුවා දක්වන සාක්ෂියක් වන අතර, එය මෙලොව සියලු වින්දනීය සම්පත් වලට වඩා ප්‍රමුඛ වේ.

මෙය වනාහි සැබැවින් ම සලාතය (අනිවාර්ය පංචකාලීන නැමදුම) වෙත ආරාධනා කරන ඇරයුමකි. එකී සලාතය පරමාධිපතියා සහ ගැත්තා අතර සිදුවන

ඍජු සම්බන්ධතාවයකි. සමාජ පන්තිභේද කඩා බිඳ දමන ඇදහිල්ලකි. සියලු ම මිනිසුන් ඔවුන්ගේ පරමාධිපතියාණන් ඉදිරියේ මෙය සමාන කරවයි.

## හය්ය අලල් ෆලාහ්, හය්ය අලල් ෆලාහ්,

විජයග්‍රහණය වෙත වහා පැමිණෙන්න

විජයග්‍රහණය යන්නෙහි මෙලොව මෙන් ම මතු ලොවෙහි තෘප්තිය, සාර්ථකත්වය, සමාදානය, ආරක්ෂාව, සදාකාලික පරමානන්දය, සහ නිවැරදි මාර්ගය වෙත මග පෙන්වීම යනාදි සියලු දෑ ඇතුළත් වේ.

එහි අර්ථවලින් ගම්‍ය වන තවත් දෑ නම්, අල්ලාහ්ගේ තෘප්තිය දිනා ගැනීම, ස්වර්ගයට පිවිසීම සහ අපා ගින්නෙන් මිදී ගැලවීම යි. මක් නිසා ද යත් කවරෙක් විශ්වාසය තබා නැමදුම් ඉෂ්ට කළේ ද, ඔහු නියත ව ම ජය ලැබීය; කවරෙක් ජය

ලැබුවේ ද ඔහු (නිරයෙන්) ගැලවී ස්වර්ගයේ නිත්‍ය සදාකාලිකත්වය දිනා ගන්නේය.

මුඅද්දින් (සලාතය සඳහා කැඳවන්නා) සලාතය සඳහා සෑම අවස්ථාවක ම ඒක දේවත්වය කෙරෙහි විශ්වාසය තැබූවන්ට සිහිපත් කරනුයේ සැනසුම, සුරක්ෂිතබව, චිත්ත නිස්කලංකබව, ආත්ම පවිත්‍රතාවය, මෙලොව හා මතුලොව පරමානන්දය වැනි දෑ කරා යුහුසුලු ව පැමිණෙන ලෙස යි.

## අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, ලා ඉලාහ ඉල්ලා අල්ලාහ්.

තක්බීර් (ඒකීය දෙවිදාණන්ගේ ශ්‍රේෂ්ඨත්වය) හා තව්හීද් (ඒක දේවත්වය) සමඟින් මෙය නිමා වේ.

"අල්ලාහු අක්බර්" (අල්ලාහ් අතිශ්‍රේෂ්ඨ යි) යන වාක්‍යය නැවත පවසමින් හා "ලා ඉලාහ ඉල්ලල්ලාහ්" (අල්ලාහ් හැර නැමදුම් ලැබීමට සුදුසු කිසිදු දෙවියෙක්

නැත) යන්න තහවුරු කරමින් අදානය (සලාත් ඇරයුම) අවසන් වේ. මෙකී වාක්‍ය දෙක පෙර සඳහන් කරුණු තහවුරු කරන අතර, මිනිස් ජීවන පැවැත්මේ කේන්ද්‍රස්ථානය ඇත්තේ ද මෙදෙක මත යි. පවත්නා විශ්ව යථාර්ථයන් අතුරින් සැබෑ ම යථාර්ථය ද මෙය යි. මිනිසා එය අවබෝධ කරත් නොකරත්, දැනුම්වත් වූවත් නොවුවත්; එකී අතිමහත් යථාර්ථයන්වලට ඒ කෙරෙහි ඇති ඇතැම් මිනිසුන්ගේ මුග්ධබව කිසිදු හානියක් නොකරයි. කාලය කොපමණ ගත වූවත්, සිදුවීම් කොපමණ අඛණ්ඩ ව පැවැතුණත්, කිසිවිටෙක මෙම සත්‍යය වෙනස් නොවේ. එය වනාහි, අල්ලාහ් සියලු දෑට වඩා අතිශ්‍රේෂ්ඨ ය, අල්ලාහ් ම ය සත්‍ය දෙවිඳාණන් වනුයේ, නැමදුම් ලැබීමට එක ම සුදුස්සා ඔහු ම ය, ඔහු හැර වෙනත් දෑට නැමදුම් කිරීම මිථ්‍යාවකි.

එකී වාක්‍ය අල්ලාහ් ගරුබුහුමන් කළ දේවල්වලට ගරුබුහුමන් කිරීමේ ඇරයුමක් වන අතර, අල්ලාහ් තමන් පිළිබඳ ව සාක්ෂි දරන දේවල් උදෙසා අල්ලාහ් වෙත වූ සාක්ෂි දීමකි එය. එමෙන් ම අල්ලාහ්ගේ දේව දූතයෝ සහ විශ්වාසවන්තයෝ ද එමඟින් සාක්ෂි ලබා දුන්හ.

නිමාව: අදාන් යනු සලාතය සඳහා වූ ඇරයුමක් පමණක් නොව, එය විජයග්‍රහණය හා සාර්ථකත්වය සඳහා වූ ඇරයුමකි. එය සන්දේශයක් වන අතර හදවත් අවදි කරවීම පිණිස දිනකට පස් වරක් මස්ජිදවලින් රැව් දෙනු ඇත. එමෙන් ම, අල්ලාහ් සමීප බව ද, සැනසුම ස්ථිර ලෙසින් හිමි කරගත හැකි බව ද, විජයග්‍රහණය සඳහා වූ මාර්ගය පටන් ගැනෙනුයේ සලාතයෙන් හා ගැත්තා සහ ඔහුගේ නිර්මාතෘ අතර ඇති සම්බන්ධතාවය මඟින් බව ද අදානය අප හට නිතින සිහි කරවයි.

මුඅද්දින් 'අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යැයි පැවසූ විට ඒකදේවත්වයේ සාක්ෂිය ඔබ ද යළි උච්චාරණය කරන්න. අල්ලාහ් තමන් පිළිබඳ ව ඉදිරිපත් කළ සාක්ෂිය හා උතුමාණන්ගේ දේව දූතයින් ගෙන ආ සත්‍යය වෙනුවෙන් ඔබ ද සාක්ෂි දරන්න. එකල, ඔබ ජයග්‍රාහකයින් හා ඒකදේවවාදය පිළිගත් මුස්ලිම්වරුන් අතුරින් කෙනෙකු වනු ඇත.

ඔබේ හදවත විශ්වාසය උදෙසා විවර කර, "අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්, වඅෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්" යනුවෙන් පවසන්න. එවිට ඔබ අල්ලාහ්ගේ කරුණාවට ඇතුළු වන අතර, මෙලොව පරමානන්දය සහ මතුලොව සුරක්ෂිතභාවය ලබා ගනිමින්, විශ්වාසවන්තයින්ගේ සමූහය සමඟින් පරමාන්ත දින යළි ප්‍රාණය ලබා නැවත නැගී සිටුවනු ලබනු ඇත.

# පටුන


අදාන්හි සඳහන් වදන්හි අර්ථ විග්‍රහය ....................................... 2
අදාන්හි වදන් විග්‍රහය ....................................... 2
අදාන්හි පද්‍ය පන්තිය මෙපරිදි ය: ....................................... 3
අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්. ....................................... 3
අෂ්හදු අන්ලා ඉලාහ ඉල්ලල්ලාහ් ....................................... 6
අෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ්, අෂ්හදු අන්න මුහම්මදන් රසූලුල්ලාහ් ....................................... 9
හය්ය අලස් සලාහ්, හය්ය අලස් සලාහ් ....................................... 13
හය්ය අලල් ෆලාහ්, හය්ය අලල් ෆලාහ්, ....................................... 15
අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, ලා ඉලාහ ඉල්ලා අල්ලාහ්. ....................................... 16


si466v1.1 - 06/09/2026